## 43 - මගෙ හද සමිඳුන්

මගෙ හද සමිඳුන් වෙතට ඇදේ
එතුමන් තුල ජීවනය ඇතේ
සැනසුම නිති සැප දෙවිඳු වෙතේ
කවදා එතුමන් දැක ගන්නේ

ගලන දියට ආශාවෙන් පෙළෙන මුවකු ලෙසින්
දෙවියනි මාගේ ආත්මය ඔබවෙත ඇදී එන්නේය

ජීවමාන දෙවියන් කෙරෙහි
මාගේ ආත්මය පිපාසයෙන් පෙළෙන්නේය

මට කවදා දෙවිඳුන්ගේ මුහුණ
දැකගන්නට ලැබෙන්නේද

දෙවිඳුන් කෙරෙහි බලාපොරොත්තු වන්න
මම තවම ගැලවුම්කාර දෙවිඳුන්ට ප්‍රශංසා කරමි

පිතා පුත්‍රයා සහ ශුද්ධාත්මයාණන්ට
දැනුත් සදහටත් මහිමය වේවා